23·9·909

# Sinhalese Grammar

for

**Standard V.**

by

The Revd. Theodore G. Perera.

# සිංහල ව්‍යාකරණ

පස්වෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිතයි.

1909

පොතක මිල ශත 15 යි.

# සිංහල ව්‍යාකරණ.

# Sinhalese Grammar.

### පස්වෙනි ප්‍රමාණයට.

## I නාම සහ සර්වනාමයන්ගේ වරනැගිල්ල.

## The Declension of Nouns and Pronouns.

1. වාක්‍යයක නාම සහ සර්වනාම නව ප්‍රකාරයකට යෙදෙත්. ඒ වෙනස් වෙනස් විධියේ යෙදීමට විභක්ති ගැනීමයයි කියනු ලැබේ. ඒ ක්‍රමයට සිංහල ව්‍යාකරණයෙහි විභක්ති නවයෙක් ඇතිවෙත්.

එනම්:- **ප්‍රථමා, කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර** සහ **ආලපන** යනුවේ.

මිට ශුද්ධ සිංහලෙහි **පෙර, කම්, කතු, කරණ, සපදන්, අවදි, සබඳ, අදර** සහ **අලප්** යයි කියනු ලැබේ.

2. (1) වාක්‍යයක අවසාන ක්‍රියාව හා බැඳෙන පදය ප්‍රථමාවිභක්ති යෙහි යෙදේ+

උදාහරණ* **දාසයා** දුන්නේය.

(2) ක්‍රියාවට යටත්වන පදාර්ථය කර්මවිභක්තියෙහි යෙදේ.

---

+මිනිසා, ගැහැනී ආදී නාම මාත්‍රය හඟවන ශබ්දද ප්‍රථමාවිභක්තියෙහි වෙත්.

*උදාහරණවල කළු අකුරෙන් මුද්‍රිත ශබ්ද ඒ ඒ විභක්ති ආශ්‍රිත පද වෙති.

උදා:- දාසයා **වතුර** දුන්නේය.

(3) ක්‍රියාව කරන්නා දක්වන පදය කර්තෘ විභක්ති යෙහි යෙදේ.

උදා:- දාසයා **උඹ** විසින් ගෙනා වතුර දුන්නේය.

(4) ක්‍රියා කිරීමට උපකාරවන්නේ කරණවිභක්ති යෙහි යෙදේ.

උදා:- දාසයා උඹ විසින් ගෙනා වතුර **කෝප්පයෙන්** දුන්නේය.

(5) යමක් ලබන තැනැත්තා දක්වන පදය සම්ප්‍රදාන විභක්ති යෙහි යෙදේ.

උදා:- දාසයා උඹ විසින් ගෙනා වතුර **බල්ලාට** කෝප්පයෙන් දුන්නේය.

(6) පහවීමේ ඉම දක්වන පදය අවධිවිභක්ති යෙහි යෙදේ.

උදා:- දාසයා උඹ විසින් අලුත් **ලිඳෙන්** ගෙනා වතුර බල්ලාට කෝප්පයෙන් දුන්නේය.

(7) යමක අයිතිකාරයා හඟවන ශබ්දය සම්බන්ධ විභක්තියෙහි යෙදේ.

උදා:- දාසයා උඹ විසින් **මාමාලාගේ** අලුත් ලිඳෙන් ගෙනා වතුර බල්ලාට කෝප්පයෙන් දුන්නේය.

(8) ක්‍රියා දැරීමට ආධාර වන්නක් ආධාර විභක්ති යෙහි යෙදේ.

උදා:- දාසයා උඹ විසින් මාමාලාගේ අලුත් ලිඳෙන් ගෙනාවතුර **මිදුලේ** තැන්ගෙසිටන් බල්ලාට කෝප්පයෙන් දුන්නේය.

(9) යමෙකු ආමන්ත්‍රණ කිරීමේදී ව්‍යවහාරකරන ශබ්දය ආලපන විභක්තියෙහි සිටී. උදා: එම්බා පුත

දූසයා උඹ විසින් මාමාලාගේ අලුත් ලිඳෙන් ගෙනා වතුර මුළුතැන්ගෙයි උන් බල්ලාට කොනලෙන් දුන්නේය.

යටකී වාක්‍යයෙහි ඇති නාමපද අට සහ සර්වනාම පදය වෙන වෙනම විභක්තිනවය ආශ්‍රයකර තිබෙන හැටී පැහැදිලිව ප්‍රකාශවේ.

———o———

## 1 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන පාඨයන්හි ඇති නාම සහ සර්වනාම පද කුමන විභක්ති භජනය කරන්දැයි කියනු.

(1)සිංහයෝ තණ නොකත්. (2) බඹරුන් රොන් ගත් මල වැටුණේය. (3) හෙතෙම අලසකමින් සතර නුගන්නේය. (4) ගුරුවරු ළමයින්ට අකුරු උගන් වති. (5) ගඟෙහි වැටුණ මිනිහාට ගොනෙක් ඇත්තේ ය. (6) මගේ පොත මේසේ උඩ තැබිමි. (7) අම්මේ මට බඩගිනියි. (8) ළමයිනි උඹලා පෙරේරා විසින් සැපයූ පාඩමට පහසු මේ කුඩා පොත වෑයමෙන් ඉගෙන උඩගුවෙන් තොරවැ ගුරුන්ගේ සෙවනෙහි හැසිරෙව්.

———o———

3. නාම සහ සර්වනාම ඒ ඒ විභක්තිවල පිහිටි වූවා පිළියෙල කිරීමට **වරනැගීම** යයි කියනු ලැබේ.

4. නාම ශබ්ද ස්වරාන්තය හලන්තය කියා කොටස් දෙකකට බෙදෙත්. ස්වරාන්ත යනු ස්වරය කින් අන්තිම වන ශබ්දයි. හලන්ත යනු අල් අකුර කින් අන්තිමවන ශබ්දයි.

## 1. ස්වරාන්ත ශබ්දයන්ගේ වරනැඟීම.

### සප්‍රාණ පුල්ලිඞ්ගික ශබ්ද.

**1. කුමර ශබ්දය. අකාරන්තයි.**

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමාවිභක්තිය | කුමරා | කුමරු, කුමරහු |
| කර්ම ,, | කුමරා, කුමරු | කුමරුන් |
| කර්තෘ ,, | කුමරා, කුමරු(විසින්) | කුමරුන්(විසින්) |
| කරණ ,, | කුමරා, කුමරු කරණකොට | කුමරුන්කරණ කොට |
| සම්ප්‍රදාන ,, | කුමරාට, කුමරුට කුමරාහට, කුමරුහට | කුමරුන්ට කුමරුන්හට |
| අවධි ,, | කුමරාගෙන්, කුමරුගෙන් | කුමරුන්ගෙන් |
| සම්බන්ධ ,, | කුමරාගේ, කුමරුගේ | කුමරුන්ගේ |
| ආධාර ,, | කුමරා කෙරෙහි කුමරු කෙරෙහි | කුමරුන් කෙරෙහි |
| ආලපන ,, | කුමර, කුමරෝ | කුමරුනි, කුමරුනේ |

බමර, දෙබර, මොනර, සොර, දෙමළ, උරග, තුරඟ යනාදියද මෙසේයි.

ලෙහෙන (ලේන), ගෝණ ආදි අකාරන්ත ඇතම් ශබ්දයන්ට විරූපසඞ්ඛ විධියෙන් බහුවචන සෑදෙතත් මෙලෙසම වරනැගෙත්.

**සැලකිය යුතුයි:—** (1) ප්‍රථමාවිභක්ති ඒකවචනයට "තෙම" "තෙමේ" යන නිපාතද; බහුවචනයට "තුමු" යන නිපාතයද සුඛාවබොධය පිණිස බොහෝ විට යොදනු ලැබේ. එසේ යෙදීම ප්‍රකෘතිශබ්ද සමගද කළ හැකිය.

(2.) කර්තෘ විභක්තියට අයිති විසින් යන නිපාතය බොහෝවිට අත්හරිනු ලැබේ.

(3.) කෙරෙහි යනු කෙරේ කියාද යෙදේ.

(4.) අවධි විභක්තියේ ගෙන් යන්න වෙනුවට "කෙරෙන්" කියාද ඇතම්විට ව්‍යවහාර කෙරේ.

(5.) එකවචනාර්ථ කර්මාදි විභක්තිවල ගැනෙනු "උ" ප්‍රත්‍යය නිරශචිතවාචි ශබ්ද වරනැඟීමේදී ව්‍යවහාර නොවේ.

### 2. රජශබ්දය. අකාරාන්තයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | — රජා, රජ | රජහු |
| කර්ම | — රජා, රජු, රජහු | රජුන් |
| කර්තෘ | — රජා, රජු, රජහු | රජුන් |
| කරණ | — රජා කරණකොට රජ කරණකොට | රජුන් කරණකොට |
| සම්ප්‍රදාන | — රජාට, රජුට, රජහට | රජුන්ට, රජුන්හට |
| අවධි | — රජාගෙන්, රජුගෙන් | රජුන්ගෙන් |
| සම්බන්ධ | — රජාගේ, රජුගේ | රජුන්ගේ |
| ආධාර | — රජා කෙරෙහි, රජු කෙරෙහි | රජුන්කෙරෙහි |
| ආලපන | — රජ | රජුනි |

හෙරණ ආදි ශබ්දද මෙසේයි.

### 3. පිළාශබ්දය. ආකාරාන්තයි.
(වකාරාගමව වරනැගේ)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | — පිළවා | පිළවු |
| කර්ම | — පිළවා | පිළවුන් |
| කර්තෘ | — පිළවා (විසින්) | පිළවුන් (විසින්) |

කරණ - රිලවා කරණ
කොට රිලවුන් කරණකොට
සම්ප්‍රදාන— රිලවාට, රිලවා හට රිලවුන්ට, රිලවුන්හට
අවධි — රිලවාගෙන් රිලවුන්ගෙන්
සම්බන්ධ — රිලවාගේ රිලවුන්ගේ
ආධාර — රිලවා කෙරෙහි රිලවුන් කෙරෙහි
ආලපන— රිලව, රිලවෝ රිලවුනි, රිලවුනේ

කිරා ආදි ශබ්දද මෙසේයි. ලමා ආදි ශබ්දද යකාරාගමව මෙලෙසම වරනැගේ.

**4. උරැලෑ ශබ්දය,** ඇකාරාන්තයි.
වකාරාගමව වරනැගේ.

ප්‍රථම උරුලෑවා උරුලෑවෝ
කර්ම උරුලෑවා උරුලෑවන්
කර්තෘ උරුලෑවා (විසින්) උරුලෑවන් (විසින්)
කරණ උරුලෑවාකරණ
කොට උරුලෑවන්කරණකොට
සම්ප්‍රදාන උරුලෑවාට, උරුලෑවා හට උරුලෑවන්ට, උරුලෑවන් හට
අවධි උරුලෑවාගෙන් උරුලෑවන්ගෙන්
සම්බන්ධ උරුලෑවාගේ උරුලෑවන්ගේ
ආධාර උරුලෑවාකෙරෙහි උරුලෑවන් කෙරෙහි
ආලපන උරුලෑව, උරුලෑවෝ උරුලෑවෙනි

ඉත්තෑ, කබල්ලෑ යනාදියද මෙසේයි. පත්තෑ යනාදියත් යකාරාගමවූව වරනැගෙනු මෙසේමැයි.

**5. කොටි ශබ්දය.** ඉකාරන්තයි.
(යකාරාගමව වරනැගේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | කොටියා | කොටි, කොටිහු, කොටියෝ |
| කර්ම | කොටියා | කොටින්, කොටියන් |
| කර්තෘ | කොටියා (විසින්) | කොටින් (විසින්), කොටියන් (විසින්) |
| කරණ | කොටියාකරණකොට | කොටින්කරණකොට, කොටියන්කරණකොට |
| සම්ප්‍රදාන | කොටියාට, කොටියාහට | කොටියන්ට, කොටින්ට, කොටියන්හට |
| අවධි | කොටියාගෙන් | කොටින්ගෙන්, කොටියන්ගෙන් |
| සම්බන්ධ | කොටියාගේ | කොටින්ගේ, කොටියන්ගේ |
| ආධාර | කොටියාකෙරෙහි | කොටින්කෙරෙහි, කොටියන්කෙරෙහි |
| ආලපන | කොටිය, කොටියෝ | කොටිනි, කොටියෙනි, කොටියනෝ |

මුගටි, කපටි, ඇමති යනාදී ශබ්දද මෙසේයි.

**6. වැදිශබ්දය.** ඉකාරාන්තයි (විත්තව වරනැගේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | වැද්දා | වැද්දෝ |
| කර්ම | වැද්දා | වැද්දන් |
| කර්තෘ | වැද්දා (විසින්) | වැද්දන් (විසින්) |
| කරණ | වැද්දාකරණකොට | වැද්දන්කරණකොට |
| සම්ප්‍රදාන | වැද්දාට, වැද්දාහට | වැද්දන්ට, වැද්දන්හට |
| අවධි | වැද්දාගෙන් | වැද්දන්ගෙන් |
| සම්බන්ධ | වැද්දාගේ | වැද්දන්ගේ |

| | | |
|---|---|---|
| ආධාර | වැද්දාකෙරෙහි | වැද්දන්කෙරෙහි |
| ආලපන | වැද්ද, වැද්දේ | වැද්දෙනි, වැද්දෙනි |

වැදි ශබ්දයෙන් විදින තැනැත්තා කියත්. බෙලි, ගැති යනාදියද මෙසේයි.

යකාරාගමව වරනැගෙන වැදි ශබ්දයකුදු ඇත. ඒ වනාහි වැදි ශබ්දයෙන් බිඳුණේයි. ඉන් වාදිකයන් හෝ වැදි හට්ටයන් කියනු ලැබේ.

## 7. මිශබ්දය. ඊකාරාන්තයි.

(මකාරාගමව වරනැගේ)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | මීමා | මීමෝ, මීමුු |
| කර්ම | මීමා | මීමුන් |
| කර්තෘ | මීමා (විසින්) | මීමුන් (විසින්) |
| කරණ | මීමා කරණකොට | මීමුන් කරණකොට |
| සම්ප්‍රදාන | මීමාට, මීමාහට | මීමුන්ට, මීමුන්හට |
| අවධි | මීමාගෙන් | මීමුන්ගෙන් |
| සම්බන්ධ | මීමාගේ | මීමුන්ගේ |
| ආධාර | මීමාකෙරෙහි | මීමුන්කෙරෙහි |
| ආලපන | මීමෝ | මීමුනි |

## 8. මිශබ්දය ඊකාරන්තයි.

(යකාරාගමව වරනැගේ.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම | මීයා | මීයෝ |
| කර්ම | මීයා | මීයන් |
| කර්තෘ | මීයා( විසින්) | මීයන් (විසින්) |
| කරණ | මීයාකරණකොට | මීයන්කරණකොට |
| සම්ප්‍රදාන | මීයාට, මීයාහට | මීයන්ට, මීයන්හට |
| අවධි | මීයාගෙන් | මීයන්ගෙන් |
| සම්බන්ධ | මීයාගේ | මීයන්ගේ |
| ආධාර | මීයාකෙරෙහි | මීයන්කෙරෙහි |

ආලපන මීයේ, මීයෝ මීයෙනි

පක්ෂිවාචි "මී" ශබ්දාදියද මෙසේයි.

9. බමුණු ශබ්දය. උකාරාන්තයි.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | බමුණා | බමුණෝ |
| කර්ම | බමුණා | බමුණන් |
| කර්තෘ | බමුණා (විසින්) | බමුණන් (විසින්) |
| කරණ | බමුණාකරණකොට | බමුණන්කරණකොට |
| සම්ප්‍රදාන | බමුණාට, බමුණාහට | බමුණන්ට, බමුණන්හට |
| අවධි | බමුණාගෙන් | බමුණන්ගෙන් |
| සම්බන්ධ | බමුණාගේ | බමුණන්ගේ |
| ආධාර | බමුණාකෙරෙහි | බමුණන්කෙරෙහි |
| ආලපන | බමුණ, බමුණෝ | බමුණෙනි |

හතුරු, මිතුරු, කපුටු, ඇඳුරු, සොහොයුරු වඳුරු යනාදියත් මෙසේයි.

10. වඩු ශබ්. උකාරාන්තයි. (වකාරාගමව වරනැගේ·)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | වඩුවා | වඩුවෝ |
| කර්ම | වඩුවා | වඩුවන් |
| කර්තෘ | වඩුවා (විසින්) | වඩුවන් (විසින්) |
| කරණ | වඩුවාකරණකොට | වඩුවන්කරණකොට |
| සම්ප්‍රදාන | වඩුවාට, වඩුවාහට | වඩුවන්ට, වඩුවන්හට |
| අවධි | වඩුවාගෙන් | වඩුවන්ගෙන් |
| සම්බන්ධ | වඩුවාගේ | වඩුවන්ගේ |
| ආධාර | වඩුවාකෙරෙහි | වඩුවන්කෙරෙහි |
| ආලපන | වඩුව, වඩුවෝ | වඩුවෙනි |

මඩු, එළු, බැටළු, මඳුරු, වටු, ඔටු යනාදියද මෙසේයි.

**11.** බලුශබ්දය. උකාරාන්තයි (චින්තව වරනැගේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | බල්ලා | බල්ලෝ |
| කර්‍ම | බල්ලා | බල්ලන් |
| කර්‍තෘ | බල්ලා (විසින්) | බල්ලන්(විසින්) |
| කරණ | බල්ලාකාරණකොට | බල්ලන්කරණකොට |
| සම්ප්‍රදාන | බල්ලාට, බල්ලාහට | බල්ලන්ට, බල්ලන්හට |
| අවධි | බල්ලාගෙන් | බල්ලන්ගෙන් |
| සම්බන්ධ | බල්ලාගේ | බල්ලන්ගේ |
| ආධාර | බල්ලාකෙරෙහි | බල්ලන්කෙරෙහි |
| ආලපන | බල්ලා, බල්ලෝ | බල්ලෙනි |

මහලු, කුරුලු යනාදියද මෙසේයි.

**12** වේශබ්. ඒකාරාන්තයි. (යකාරාගමව වරනැගේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | වේයා | වේයෝ |
| කර්‍ම | වේයා | වේයන් |
| කර්‍තෘ | වේයා (විසින්) | වේයන් (විසින්) |
| කරණ | වේයාකාරණකොට | වේයන්කරණකොට |
| සම්ප්‍රදාන | වේයාට, වේයාහට | වේයන්ට, වේයන්හට |
| අවධි | වේයාගෙන් | වේයන්ගෙන් |
| සම්බන්ධ | වේයාගේ | වේයන්ගේ |
| ආධාර | වේයාකෙරෙහි | වේයන්කෙරෙහි |
| ආලපන | වේයෝ | වේයෙනි |

වේ ශබ්දයෙන් එනම් කුඩා සතුන් කියත්. සේ, රේ යනාදියද මෙසේයි.

### සප්‍රාණ ස්ත්‍රීලිඞ්ගික ශබ්ද.

**13.** ලිය ශබ්දය. (අකාරාන්තයි)

| | එකවචන. | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ලිය | ලියෝ |
| කර්‍ම | ලිය | ලියන් |

| | | |
|---|---|---|
| කර්තෘ | ලිය (විසින්) | ලියන් (විසින්) |
| කරණ | ලිය කරණකොට | ලියන් කරණකොට |
| සම්ප්‍රදාන | ලියට, ලියහට | ලියන්ට, ලියන්හට |
| අවධි | ලියගෙන් | ලියන්ගෙන් |
| සම්බන්ධ | ලියගේ | ලියන්ගේ |
| ආධාර | ලිය කෙරෙහි | ලියන් කෙරෙහි |
| ආලපන | ලිය, ලියේ | ලියෙනි |

පිය, (භාර්‍ය්‍යා) රිය (රථී) අසර (අප්සරා) වෙළඹ, සෙබඩ, අඟන යනාදි ශබ්දද මෙසේයි.

**14.** **පමා** (ස්ත්‍රී) ශබ්දය ආකාරාන්තයි. (වකාරාගමව වරනැගේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | පමා | පමාවෝ |
| කර්ම | පමාව | පමාවන් |
| කර්තෘ | පමාව (විසින්) | පමාවන් (විසින්) |
| කරණ | පමාව කරණකොට | පමාවන් කරණකොට |
| සම්ප්‍රදාන | පමාවට, පමාවහට | පමාවන්ට, පමාවන්හට |
| අවධි | පමාවගෙන් | පමාවන්ගෙන් |
| සම්බන්ධ | පමාවගේ | පමාවන්ගේ |
| ආධාර | පමාව කෙරෙහි | පමාවන් කෙරෙහි |
| ආලපන | පමාව | පමාවෙනි |

රමා (සිත්කලු ස්ත්‍රී නොහොත් ශ්‍රීකාන්තා කලා (කල්දන්නී) යනාදි ශබ්දද මෙසේයි.

**15.** **ඉතිරි** ශබ්දය. (ඉකාරාන්තයි. යකාරාගමව වරනැගේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | ඉතිරි | ඉතිරියෝ |
| කර්ම | ඉතිරිය | ඉතිරියන් |
| කර්තෘ | ඉතිරිය (විසින්) | ඉතිරියන් (විසින්) |

| | | |
|---|---|---|
| කරණ | ඉතිරිය කරණකොට | ඉතිරියන් කරණ කොට |
| සම්ප්‍රදාන | ඉතිරියට, ඉතිරියහට | ඉතිරියන්ට, ඉතිරි යන් හට |
| අවධි | ඉතිරියගෙන් | ඉතිරියන්ගෙන් |
| සම්බන්ධ | ඉතිරියගේ | ඉතිරියන්ගේ |
| ආධාර | ඉතිරිය කෙරෙහි | ඉතිරියන්කෙරෙහි |
| ආලපන | ඉතිරියේ | ඉතිරියෙනි |

මියුලැසි, දිගැසි, සිරි, සරසවි, වම් යනාදි ශබ්ද ද මෙසේයි.

16 ඊරී ශබ්. ඊකාරාන්තයි. (යකාරාගමව වරනැඟේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | ඊරී | ඊරියෝ |
| කර්ම | ඊරිය | ඊරියන් |
| කර්තෘ | ඊරිය (විසින්) | ඊරියන් (විසින්) |
| කරණ | ඊරිය කරණකොට | ඊරියන් කරණකොට |
| සම්ප්‍රදාන | ඊරියට, ඊරියහට | ඊරියන්ට,ඊරියන්හට |
| අවධි | ඊරියගෙන් | ඊරියන්ගෙන් |
| සම්බන්ධ | ඊරියගේ | ඊරියන්ගේ |
| ආධාර | ඊරිය කෙරෙහි | ඊරියන් කෙරෙහි |
| ආලපන | ඊරියේ | ඊරියෙනි |

කුමරී, යෙහෙළී, මැහැලී, සැතිරී, නැයිනී ආදි ශබ්දද මෙසේයි.

17. අඹු ශබ්. උකාරාන්තයි. (වකාරාගමව වරනැඟේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | අඹු | අඹුවෝ |
| කර්ම | අඹුව | අඹුවන් |
| කර්තෘ | අඹුව (විසින්) | අඹුවන් (විසින්) |
| කරණ | අඹුව කරණකොට | අඹුවන් කරණකොට |

| | | |
|---|---|---|
| සම්ප්‍රදාන | අඹුවට, අඹුවහට | අඹුවන්ට, අඹුවන්හට |
| අවධි | අඹුවගෙන් | අඹුවන්ගෙන් |
| සම්බන්ධ | අඹුවගේ | අඹුවන්ගේ |
| ආධාර | අඹුව කෙරෙහි | අඹුවන් කෙරෙහි |
| ආලපන | අඹුව, අඹුවේ | අඹුවෙනි |

වැන්දඹු, දූනු (ජනිතවූ තැනැත්තී) ආදි ශබ්දද මෙසේයි.

**18. ගැහැනු** ශබ්දය. උකාරාන්තයි.
(යකාරාගමව වරනැගේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | ගැහැනි, ගැහැනිය | ගැහැනු |
| කර්ම | ගැහැනිය | ගැහැනුන්, ගැහැනියන් |
| කර්තෘ | ගැහැනිය (විසින්) | ගැහැනුන් (විසින්), ගැහැනියන් (විසින්) |
| කරණ | ගැහැනිය කරණකොට | ගැහැනුන් කරණකොට, ගැහැනියන් කරණකොට. |
| සම්ප්‍රදාන | ගැහැනියට, ගැහැනියහට | ගැහැනුන්ට, ගැහැනියන්ට ගැහැනුන්හට, ගැහැනියන්හට |
| අවධි | ගැහැනියගෙන් | ගැහැනුන්ගෙන්, ගැහැනියන්ගෙන් |
| සම්බන්ධ | ගැහැනියගේ | ගැහැනුන්ගේ, ගැහැනියන්ගේ |
| ආධාර | ගැහැනිය කෙරෙහි | ගැහැනුන් කෙරෙහි, ගැහැනියන් කෙරෙහි |
| ආලපන | ගැහැනිය, ගැහැනියේ | ගැහැනුනි, ගැහැනුනේ |

**19. දූ** ශබ්දය. ඌකාරාන්තයි. (වකාරාගමයෙන් හා ලාප්‍රත්‍යය වැටීමෙන් වරනැගේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | දූ | දූහු, දූලා |
| කර්ම | දූ, දුව | දූන් |

| | | |
|---|---|---|
| කර්තෘ | දූ (විසින්) දුව (විසින්) | දූන්( විසින්) දූලා (විසින්) |
| කරණ | දූ කරණකොට දුව කරණකොට | දූන් කරණකොට දූලා කරණකොට |
| සම්ප්‍රදාන | දූට, දූහට, දුවට, දුවහට | දූන්ට, දූන්හට, දූලාට දූලාහට |
| අවධි | දූගෙන්, දුවගෙන් | දූන්ගෙන්, දූලාගෙන් |
| සම්බන්ධ | දූගේ, දුවගේ | දූන්ගේ, දූලාගේ |
| ආධාර | දූ කෙරෙහි, දුව කෙරෙහි | දූන් කෙරෙහි, දූලා කෙරෙහි |
| ආලපන | දුව, දුවේ | දුවෙනි |

රදූ (රජදූ) ආදි ශබ්දද මෙසේමැයි.

**20. බිසෝ ශබ්දය.** ඕකාරාන්තයි.
(වකාරාගමයෙන් වරනැඟේ)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | බිසව | බිසවී, බිසෝහු |
| කර්ම | බිසව | බිසවුන් |
| කර්තෘ | බිසව (විසින්) | බිසවුන් (විසින්) |
| කරණ | බිසවකරණකොට | බිසවුන්කරණකොට |
| සම්ප්‍රදාන | බිසවට, බිසවහට | බිසවුන්ට, බිසවුන්හට |
| අවධි | බිසවගෙන් | බිසවුන්ගෙන් |
| සම්බන්ධ | බිසවගේ | බිසවුන්ගේ |
| ආධාර | බිසව කෙරෙහි | බිසවුන්කෙරෙහි |
| ආලපන | බිසව | බිසවුනි, බිසවෙනි |

**සප්‍රාණ හලන්තශබ්ද.**

**21. මිනිස් ශබ්දය** (පුල්ලිඞ්ගිකයි)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | මිනිසා | මිනිස්සු |
| කර්ම | මිනිසා | මිනිසුන් |

| | | |
|---|---|---|
| කර්තෘ | මිනිසා (විසින්) | මිනිසුන් (විසින්) |
| කරණ | මිනිසා කරණකොට | මිනිසුන් කරණකොට |
| සම්ප්‍රදාන | මිනිසාට, මිනිසාහට | මිනිසුන්ට, මිනිසුන්හට |
| අවධි | මිනිසාගෙන් | මිනිසුන්ගෙන් |
| සම්බන්ධ | මිනිසාගේ | මිනිසුන්ගේ |
| ආධාර | මිනිසාකෙරෙහි | මිනිසුන්කෙරෙහි |
| ආලපන | මිනිස, මිනිසෙනි | මිනිසුනි, මිනිසුනේ |

මිනිස් ශබ්දය සකාරයට හකාරාදේශව මිනිහා ආදි වශයෙන් එකවචනයෙහි පමණක් වරනැඟේ.

පුත්, ගොන්, කොස්, බළල්, සත්, යක්, ඇත්, වලස් ආදි ශබ්දද මෙසේමැයි. හරක් ශබ්දයද ප්‍රථමා බහුවචනය හැර මෙසේම වරනැඟේ. එහි ප්‍රථමා බහුවචනය හරක් කියාම වේ.

**22. ගොව් ශබ්දය (පුල්ලිඞ්ගයි. විතානව වරනැඟේ.)**

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ගොව්වා | ගොව්වෝ |
| කර්ම | ගොව්වා | ගොව්වන් |
| කර්තෘ | ගොව්වා (විසින්) | ගොව්වන් (විසින් |
| කරණ | ගොව්වා කරණකොට | ගොව්වන් කරණකොට |
| සම්ප්‍රදාන | ගොව්වාට, ගොව්වාහට | ගොව්වන්ට, ගොව්වන්හට |
| අවධි | ගොව්වාගෙන් | ගොව්වන්ගෙන් |
| සම්බන්ධ | ගොව්වාගේ | ගොව්වන්ගේ |
| ආධාර | ගොව්වාකෙරෙහි | ගොව්වන්කෙරෙහි |
| ආලපන | ගොව්ව, ගොව්වෙ | ගොව්වෙනි, ගොව්වනේ |

ගොව් යනු පාලක (රැකබලන්නා) යන අර්ථයි. පොව්, හොය් ආදි ශබ්දද මෙසේමැයි.

**23 පොලොං ශබ්දය** (අනුස්වාරාන්ත පුල්ලිඞ්ගිකයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| **ප්‍රථමා** | පොලිඟා | පොලොංගු |
| **කර්ම** | පොලිඟා | පොලිඟුන් |
| **කර්තෘ** | පොලිඟා (විසින්) | පොලිඟුන් (විසින්) |
| **කරණ** | පොලිඟා කරණකොට | පොලිඟුන්කරණ කොට |
| සම්ප්‍රදාන | පොලිඟාට, පොලිඟාහට | පොලිඟුන්ට, පොලිඟුන්හට |
| අවධි | පොලිඟාගෙන් | පොලිඟුන්ගෙන් |
| සම්බන්ධ | පොලිඟාගේ | පොලිඟුන්ගේ |
| ආධාර | පොලිඟාකෙරෙහි | පොලිඟුන්කෙරෙහි |
| ආලපන | පොලිඟා, පොලිඟෝ | පොලිඟුනි, පොලිඟුනේ |

**24. කත** ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගිකයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| **ප්‍රථමා** | කත | කත්තු |
| **කර්ම** | කත | කතුන් |
| **කර්තෘ** | කත (විසින්) | කතුන් (විසින්) |
| **කරණ** | කත කරණකොට | කතුන් කරණකොට |
| **සම්ප්‍රදාන** | කතට, කතහට | කතුන්ට, කතුන්හට |
| **අවධි** | කතගෙන් | කතුන්ගෙන් |
| **සම්බන්ධ** | කතගේ | කතුන්ගේ |
| **ආධාර** | කත කෙරෙහි | කතුන් කෙරෙහි |
| **ආලපන** | කත, කතේ | කතුනි, කතුනේ |

දෙන්, මානම් ආදී ශබ්දද මෙසේමැයි.

**25. නං** ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගිකයි.) අනුස්වාරාන්තයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| **ප්‍රථමා** | නඟා, (නංගී) | නඟාලා, (නංගිලා) |
| **කර්ම** | නඟා, (නංගී) | නඟුන්, (නංගිලා) |

| | | |
|---|---|---|
| කර්තෘ | නගා (විසින්) | නගුන් (විසින්) |
| කරණ | නගා කරණකොට | නගුන් කරණකොට |
| සම්ප්‍රදාන | නගාට, නගාහට | නගුන්ට, නගුන්හට |
| අවධි | නගාගෙන් | නගුන්ගෙන් |
| සම්බන්ධ | නගාගේ | නගුන්ගේ |
| ආධාර | නගා කෙරෙහි | නගුන් කෙරෙහි |
| ආලපන | නඟේ, (නංගියේ) | නගුනි, නගුනේ |

**සංඥාර්ථක ශබ්ද පිළිබඳ විශේෂ කාරණු.**

1. ඇතම් ශබ්දයන්ට ගෞරවාර්ථයෙහි ආණ, අණු, අණි, ඇණි යන ප්‍රත්‍යය වැටී පියාණෝ, පුතණුවෝ, දුවණියෝ, මෑණියෝ ආදි වශයෙන් එකවචනාර්ථයෙහි බහුවචනව වරනැගෙත්.

2. සමහර ශබ්දයන්ට වත්, මත් සහ තර ප්‍රත්‍යද වැටී දනවතා, දනවත්හු, සිරිමතා, සිරිමත්හු, බලතරයා, බලතරයෝ ආදි වශයෙන් වරනැගෙත්.

3. ඇතම් ශබ්දයන්ට ගෞරවාර්ථයෙහි වර, දරු යන ශබ්ද එකතුව ගුරුවරයා, ගුරුවරයෝ, රජදරුවා, රජදරුවෝ ආදි වශයෙන් වරනැගෙත්.

4. ඇතම් තැන යටකී ප්‍රත්‍ය සහ ශබ්ද වෙන ශබ්ද හා ගැලපී වරනැගෙත්. ගුරුවරයාණෝ, රජ දරුවාණෝ, දනවතාණෝ, සිරිමතාණෝ ආදිය මීට නිදර්ශනයි.

5. කිසි ශබ්ද කෙනෙකුන්ට ගෞරවාර්ථයෙහි වහන්දෑ, දෑ, වහන්සේ යන ශබ්ද උත්තර පදවශයෙන් වැටීවරනැගෙත්. බෝසත්වහන්දෑ, මෑනියන්දෑ, මහරජාණන් වහන්සේ ආදිය ඊට උදාහරණයි.

---

**4 වෙනි අභ්‍යාස පාඩම.**

(1) සිවල්, කැනතිල්, කල්, බමලත්, දුඹුල්, කම්මිත් යන ශබ්දයන් ලිඞ්ග විශේෂය දක්වා වරනගනු.

(2) ආණ, අණු, අණි, ඇණි යන ප්‍රත්‍යගත්තා ශබ්දයන්ගේ සංඛ්‍යාවිශෙෂය පැහැදිලිකොට කවර අණි යන ඒ ප්‍රත්‍ය යොදන්දැයි ලියනු. (3) ඇති යන අණි යෙහිවුවත්, මත් ප්‍රත්‍යයොදා ශබ්ද 4ක් වරනැඟීමෙන් උදාහරණ කරනු? (4) දනවතාණෝ, සිරිමතාණන් යන ශබ්දයන්ට තුමක් සඳහා කිනම් ප්‍රත්‍යයෝ වැටි තිබෙත්ද? (5) වර, දරු, ශබ්දයන් සහිත නාම 4ක් වරනඟා ඒවාටම ආණ, අණු, ආදි ප්‍රත්‍ය යෙදීමෙන් සිදුවන වෙනස පෙන්වනු.

—o—

## ස්වරාන්ත අචෙතන ශබ්ද.

**26.** වන ශබ්දය අකාරාන්තයි. (යකාරාගමව වරනැගේ)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | වනය | වන |
| කර්ම | වනය | වනයන්, වන |
| කර්තෘ | වනය | වනයන් |
| කරණ | වනයෙන්, වනෙන් | වනයන්ගෙන් |
| සම්ප්‍රදාන | වනයට | වනයන්ට |
| අවධි | වනයෙන්, වනෙන් | වනයන්ගෙන් |
| සම්බන්ධ | වනයේ, වනේ | වනයන්ගේ |
| ආධාර | වනයෙහි, වනෙහි | වනයන්හි |

දන (වස්තුව), ගුණ, පැණ, දළ, පල, හර (මුතු වැල) වණ (වණය) යනාදි ශබ්දද මෙසේමැයි.

**සැලකිය යුතුයි.** (1) ඇතම් විභක්තීන්ට යෙදෙන විසින්, කාරණකොට, කෙරෙහි යන නිපාත ආදිය අප්‍රාණික ශබ්ද හා යෙදීම ඉතා විරලයි.

(2) කාව්‍යාදියේ සප්‍රාණිකයක් මෙන් සලකා ආමන්ත්‍රණය කරන තැන්වල හැර අප්‍රාණික ශබ්ද ආලපන විභක්තියෙහි යෙදීම අප්‍රකටය.

(3) අප්‍රාණික ශබ්ද කරණ, අවධි යන දෙවි බත්හි විශෙෂයෙක් නොපැමෙත්

**27**. **රට ශබ්දය** අකාරාන්තයි. (බහුවචන "වල්" යන්නක් සමගව වරනැගෙන්.)

| | | | |
|---|---|---|---|
| ප්‍රථමා | -රට, රටවල්. | සම්ප්‍රදාන | - රටට, රටවලට |
| කර්ම | -රට, රටවල් | අවධි | - රටෙන්, රටවලින් |
| කර්තෘ | -රට, රටවල් | සම්බන්ධ | - රටේ, රටවල |
| කරණ | -රටෙන්, රටවලින් | ආධාර | - රටෙහි, රටවල, රටවලැ |

කට, වැට, තොට, දොර, ගොඩ, පාර, ඇළ, දෙළ යනාදියත් මෙසේයි. ඇඳ, කඳ යනාදියත් මෙසේ නමුදු බහුවචන ගැනීමේදි ඇඳන් කඳන් යනාදි වශයෙන්ද ව්‍යවහාරයි.

**28** **දේලා ශබ්දය**. ආකාරාන්තයි. (වකාරාගමව වල්ප්‍රත්‍යය ඇතුව හෝ නැතුව වරනැගේ).

| | | |
|---|---|---|
| ප්‍රථමා | දේලාව | දේලා, දේලාවල්, දේලාවෝ |
| කර්ම | දේලාව | දේලාවන්, දේලාවල් |
| කර්තෘ | දේලාව | දේලාවන්, දේලාවල් |
| කරණ | දේලාවෙන් | දේලාවලින්, දේලාවන්ගෙන් |
| සම්ප්‍රදාන | දේලාවට | දේලාවලට, දේලාවන්ට |
| අවධි | දේලාවෙන් | දේලාවලින්, දේලාවන්ගෙන් |
| සම්බන්ධ | දේලාවේ | දේලාවල, දේලාවන්ගේ |
| ආධාර | දේලාවෙහි | දේලාවන්හි, දේලාවල, දේලාවලැ |

සබා, මාලිනා, වීණා ආදි සබ්දද මෙසේයි.

**29. කැලෑ ශබ්දය**. ඈකාරාන්තයි. (එකවචනයෙහි වකාරාගමව බහුවචන "වල්" යන්නක් ඇතුවද වරනැගේ).

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | කැලෑව | කැලෑ |
| කර්ම | කැලෑව | කැලෑ |

| | | |
|---|---|---|
| කර්තෘ | කැලෑව | කැලෑ |
| කරණ | කැලෑවෙන් | කැලෑවලින් |
| සම්ප්‍රදාන | කැලෑවට | කැලෑවලට |
| අවධි | කැලෑවෙන් | කැලෑවලින් |
| සම්බන්ධ | කැලෑවේ | කැලෑවල |
| ආධාර | කැලෑවෙහි | කැලෑවල, කැලෑවලැ |

කොල්ලෑ, පිල්ලෑ ආදි ශබ්දද මෙසේමැයි. වෑ ආදි ශබ්ද එකවචනයෙහි යකාරාගමව මෙසේ වරනැගෙත්. රෑ ආදි ශබ්දවල කිසි විබතෙක ඈ යනු හ්‍රස්වවේ.

**30.** බැදි ශබ්දය ඉකාරාන්තයි. (එකවචනවල විතරව බහුවචන "වල්" යන්නක් ඇතුවද වරනැගේ).

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | බැද්ද | බැදි |
| කර්ම | බැද්ද | බැදි |
| කර්තෘ | බැද්ද | බැදි |
| කරණ | බැද්දෙන් | බැදිවලින් |
| සම්ප්‍රදාන | බැද්දට | බැදිවලට |
| අවධි | බැද්දෙන් | බැදිවලින් |
| සම්බන්ධ | බැද්දේ | බැදිවල |
| ආධාර | බැද්දෙහි | බැදිවල, බැදිවලැ |

ඉනි, කැනි, ඉනි, කෑලි, කෙකි, ගිනි, කැවිලි, රිකිලි, ලෑලි ආදියත් මෙසේමැයි. රිටි, කෙවිටි ආදි කිසි ශබ්දයෙක් විකල්පනාවී මෙසේ වරනැගේ. පටි ආදි ශබ්ද එකවචනයෙහි යකාරාගමව පටිය ආදි වශයෙන් වරනැගෙත්.

**31.** මී ශබ්දය. ඊකාරාන්තයි. (එකවචනවල යකාරාගමව බහුවචන "වල්" යන්නකුත් සමගවද වරනැගේ.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | මීය | මී |
| කර්ම | මීය | මී |

| | | |
|---|---|---|
| කර්තෘ | මීය | මී |
| කරණ | මීයෙන් | මීවලින් |
| සම්ප්‍රදාන | මීයට | මීවලට |
| අවධි | මීයෙන් | මීවලින් |
| සම්බන්ධ | මීයේ | මීවල |
| ආධාර | මීයෙහි | මීවල, මීවලැ |

ලී, ගී, හී, නාදී යනාදිය මෙසේමැයි. ඇතම් ඉකාරාන්ත ශබ්දද මෙසේ වරනැගෙත්. වීදි, තරාදි ආදිය ඊට නිදර්ශනයි.

32. මළු ශබ්දය. උකාරාන්තයි (එකවචනවල ඕනෑනම් බහුවචන "වල්" යන්නකුත් සමගවද වරනැගේ.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | මල්ල | මළු |
| කර්ම | මල්ල | මළු |
| කර්තෘ | මල්ල | මළු |
| කරණ | මල්ලෙන් | මළුවලින් |
| සම්ප්‍රදාන | මල්ලට | මළුවලට |
| අවධි | මල්ලෙන් | මළුවලින් |
| සම්බන්ධ | මල්ලේ | මළුවල |
| ආධාර | මල්ලෙහි | මළුවල, මළුවලැ |

බදු, හකු, කජු, හතු, වළු, වොටුනු යනාදිය මෙසේමැයි.

33. පුටු ශබ්දය. උකාරාන්තයි. (එකවචනවල වකාරාගමව බහුවචන "වල්" යන්නකු ත්සමගවද වරනැගේ.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | පුටුව | පුටු |
| කර්ම | පුටුව | පුටු |
| කර්තෘ | පුටුව | පුටු |
| කරණ | පුටුවෙන් | පුටුවලින් |
| සම්ප්‍රදාන | පුටුවට | පුටුවලට |

| | | |
|---|---|---|
| අවධි | පුටුවෙන් | පුටුවලින් |
| සම්බන්ධ | පුටුවේ | පුටුවල |
| ආධාර | පුටුවෙහි | පුටුවල, පුටුවලැ |

අටු, කොටු, කෝටු, කඩු, ගඩු, බඩු, කොපු, පපු, අරටු, කොරටු යනාදි ශබ්දද මෙසේමැයි.

**34.** පූ ශබ්දය. ඌකාරාන්තයි. (එකවචනවල වකාරාගමව බහුවචන "වල්" යන්නක් සමගවද වරනැගේ.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | පූව | පූ |
| කර්ම | පූව | පූ |
| කර්තෘ | පූව | පූ |
| කරණ | පූවෙන් | පූවලින් |
| සම්ප්‍රදාන | පූවට | පූවලට |
| අවධි | පූවෙන් | පූවලින් |
| සම්බන්ධ | පූවේ | පූවල |
| ආධාර | පූවෙහි | පූවල, පූවලැ |

බූ, (බූව) හූ, (හූව) ආදි ශබ්දද මෙසේමැයි. රූ ආදිශබ්ද එකවචනයෙහි ඍවුවද මෙසේම වරනැගේ.

**35.** ගෙ ශබ්දය. (එකාරාන්තයි.) එකවචනවල යකාරාගමව බහුවචන "වල්"යන්නක් ඇතුවමම වරනැගේ.

| | | |
|---|---|---|
| ප්‍රථමා | ගෙය, ගේ | ගෙවල් |
| කර්ම | ගෙය, ගේ | ගෙවල් |
| කර්තෘ | ගෙය, ගේ | ගෙවල් |
| කරණ | ගෙයින්, ගෙන් | ගෙවලින් |
| සම්ප්‍රදාන | ගෙයට, ගෙට | ගෙවලට |
| අවධි | ගෙයින්, ගෙන් | ගෙවලින් |
| සම්බන්ධ | ගෙයි | ගෙවල |
| ආධාර | ගෙයි, ගෙහි | ගෙවල්හි, ගෙවලැ |

**36**. **ලේ** ශබ්දය. (ඒකාරාන්තයි) එකවචනවල හ්‍රස්වව යකාරාගමව බහුවචන "වල්" යන්නක් ඇතුවද වරනැගේ.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ලෙය | ලේ |
| කර්ම | ලෙය | ලේ |
| කර්තෘ | ලෙය | ලේ |
| කරණ | ලෙයෙන්, ලේයෙන් | ලේවලින් |
| සම්ප්‍රදාන | ලෙයට, ලේට | ලේවලට |
| අවධි | ලෙයෙන්, ලේයෙන් | ලේවලින් |
| සම්බන්ධ | ලෙයේ, ලේයේ | ලේවල |
| ආධාර | ලෙයෙහි, ලේයෙහි | ලේවල, ලේවලැ |

ලේ ශබ්දය, ලොහිත, ලෙඩායන උභයාර්ථයෙහිම පැනෙන්. දේ, රේ, වේ (ජීවිය) හේ, යනාදි ශබ්දද මෙසේයි.

**37**. **පොරෝ** ශබ්දය. (ඕකාරාන්තයි.) එකවචනවල හ්‍රස්වව වකාරාගමයෙන් බහුවචන "වල්" යන්නක් ඇතුවද වරනැගේ.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | පොරොව | පොරෝ |
| කර්ම | පොරොව | පොරෝ |
| කර්තෘ | පොරොව | පොරෝ |
| කරණ | පොරොවෙන් | පොරෝවලින් |
| සම්ප්‍රදාන | පොරොවට | පොරෝවලට |
| අවධි | පොරොවෙන් | පොරෝවලින් |
| සම්බන්ධ | පොරොවේ | පොරෝවල |
| ආධාර | පොරොවෙහි | පොරෝවල, පොරෝවලැ |

ලෝ, (ලෝකය) සෝ, (ශෝකය) පොළෝ යනාදී ශබ්දද මෙසේමැයි. හෝ (ඔය) ආදි ශබ්ද යකාරාගමව මේලෙසම වරනැගේ.

---o---

## 5 වෙනි අභ්‍යාස පාඨය.

(1) මෙහි පහත දක්වන ශබ්ද වරනගනු:—

කළු, පුර, කල, ගොල්ල, සෑ, පෙති, නැටි, ගැටී, වි, වතු, නඩු, සේ සහ කෝ.

(2) මෙහි පහත දක්වන ශබ්දවල කරණවිබත් එක වචන හා සපදන් විබත් එකවචන දෙනු.

අල, ගුහා, ඇගෑ, බෙලි, දී, මුහුදු, දුනු සහ ඉසකේ.

---o---

### හලන්ත අචේතන ශබ්ද.

38. ගස් ශබ්දය. (බහුවචන "වල්"යන්නකින්ද වරනැඟේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | ගස | ගස් |
| කර්ම | ගස | ගස් |
| කර්තෘ | ගස | ගස් |
| කරණ | ගසෙන්, ගසින් | ගස්වලින් |
| සම්ප්‍රදාන | ගසට | ගස්වලට |
| අවධි | ගසෙන්, ගසින් | ගස්වලින් |
| සම්බන්ධ | ගසේ | ගස්වල |
| ආධාර | ගසෙහි | ගස්වල, ගස්වලැ |

රුක්, දුක්, හක්, මැණික්, අත්, දත්, කත්, රන්, මල්, පිල්, නැව්, දිව්, ගම්, දම්, අගල්, කිතුල් යනාදි ශබ්දද මෙසේමැයි.

39. පව් ශබ්දය. (එකවචන ගැනීමේදී විකල්ප බහුවචන "වල්"යන්නකින්ද වරනැඟේ.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | පව්ව | පව් |
| කර්ම | පව්ව | පව් |

| | | |
|---|---|---|
| කර්තෘ | පව්ව | පව් |
| කරණ | පව්වෙන් | පව්වලින් |
| සම්ප්‍රදාන | පව්වට | පව්වලට |
| අවධි | පව්වෙන් | පව්වලින් |
| සම්බන්ධ | පව්වේ | පව්වල |
| ආධාර | පව්වෙහි, පව්වේ | පව්වල, පව්වලැ |

මෙහි පව්ශබ්දයෙන් පර්වතය කියත්. ගව්, සැව් ආදි ශබ්දද මෙසේයි.

**40.** ලින් ශබ්දය. (එකවචනයෙහි න් කාර හානිව ද කාරය ගැනීමෙන්ද බහුවචන "වල" යන් තකින් යුත්වද වරනැඟේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ලිඳ | ලින් |
| කර්ම | ලිඳ | ලින් |
| කර්තෘ | ලිඳ | ලින් |
| කරණ | ලිඳෙන් | ලින්වලින් |
| සම්ප්‍රදාන | ලිඳට | ලින්වලට |
| අවධි | ලිඳෙන් | ලින්වලින් |
| සම්බන්ධ | ලිඳේ | ලින්වල |
| ආධාර | ලිඳෙහි | ලින්වල, ලින්වලැ |

**41** ගං ශබ්දය. අනුස්වාරාන්තයි. (එකවචනයෙහි අනුස්වාර හානිව ගකාරය ගැනීමෙන්ද බහුවචන "වල" යන්නක් ඇතුළුවද වරනැඟේ.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ගඟ | ගං |
| කර්ම | ගඟ | ගං |
| කර්තෘ | ගඟ | ගං |
| කරණ | ගඟින්, ගඟෙන් | ගංවලින් |
| සම්ප්‍රදාන | ගඟට | ගංවලට |
| අවධි | ගඟින්, ගඟෙන් | ගංවලින් |

| | | |
|---|---|---|
| සම්බන්ධ | ගගේ | ගංවල |
| ආධාර | ගගේ | ගංවලැ |

අං, මං, උමං ආදි ශබ්දද මෙසේයි. ගං ආදි ශබ්ද ගඞ්ගා යනාදි භාෂාන්තර ශබ්දයන්ගෙන් බිඳි මේදි පළමුකොට ග කාර ශෙෂව පැමිණ යලිත් ගාත්‍රාක්ෂර ලොපසන්ධි විධියෙන් සිඬව ගං යනාදි ප්‍රකෘතිය ගෙනතිබේයයි සිතිය හැක.

## සර්වනාම.

### 42. එ ශබ්දය. (පුම්ලිඞ්ගයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ඒ, හේ, එතෙම, හෙතෙම, ඌ | එව්හු, ඔහු, ඔව්හු, උහු, ඌලා, ඔහුතුමු, උහුතුමු ඔව්හුතුමු |
| කර්ම | ඌ, උහු, ඔහු | උන්, ඌලා, ඔවුන්, එවුන් |
| කර්තෘ | ඌ, උහු, ඔහු (විසින්) | උන්, ඌලා, ඔවුන්, එවුන්(විසින්) |
| කරණ | උගෙන්, උහුගෙන්, ඔහුගෙන්, ඔහු (කරණකොට) | උන්ගෙන්, ඌලාගෙන්, ඔවුන්ගෙන්, එවුන්ගෙන්, එවුන් (කරණකොට) |
| සම්ප්‍රදාන | ඌට, ඔහුට, උහුට, ඕහට | උන්ට, ඌලාට, ඔවුන්ට, එවුන්ට, එවුන්හට |
| අවධි | උගෙන්, උහුගෙන්, ඔහුගෙන්, ඔහු (කෙරෙන්) | උන්ගෙන්, ඌලාගෙන්, ඔවුන්ගෙන්, එවුන්ගෙන්, එවුන්(කෙරෙන්, අතුරෙන්) |
| සම්බන්ධ | උගේ, උහුගේ, ඔහුගේ | උන්ගේ, ඌලාගේ, ඔවුන්ගේ, එවුන්ගේ |

ආධාර උඹකෙරෙහි, ඔහු උන්කෙරෙහි, උඹලා
කොරෙහි, උහු කෙරෙහි, ඔවුන්කෙරෙහි,
කොරෙහි(කෙරේ) එවුන්(කෙරෙහි)

**43.** ඕ ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ඕ, ඈ, ඕතොමෝ, තොම | ඔහු, ඔව්හු, එව්හු, ඔහුතුමූ |
| කර්ම | ඈ, ඇය | ඔවුන්, එවුන් |
| කර්තෘ | ඈ, ඇය, ඈ(විසින්) | ඔවුන්, එවුන්, එවුන්(විසින්) |
| කරණ | ඇයගෙන්, ඇගෙන්, ඇය(කරණකොට) | ඔවුන්ගෙන්, එවුන්ගෙන්, එවුන්(කරණකොට) |
| සම්ප්‍රදාන | ඇයට, ඈට, ඈහට | ඔවුන්ට, එවුන්ට, එවුන්හට |
| අවධි | ඇයගෙන්, ඇගෙන්, ඇය(කෙරෙන්) | ඔවුන්ගෙන්, එවුන්ගෙන්, එවුන්(කෙරෙන්, අතුරෙන්) |
| සම්බන්ධ | ඇයගේ, ඇගේ | ඔවුන්ගේ, එවුන්ගේ |
| ආධාර | ඇයකෙරෙහි, ඈකෙරෙහි,(කෙරේ) | ඔවුන්කෙරෙහි, එවුන්කෙරෙහි |

**44.** එ ශබ්දය. (අප්‍රාණිකයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | එය, ඒක | ඒවා |
| කර්ම | එය, ඒක | ඒවා |
| කර්තෘ | එය, ඒක | ඒවා |
| කරණ | එයින්, ඉන්, ඒකෙන් | ඒවායින් |

| | | |
|---|---|---|
| සම්ප්‍රදාන | එයට, ඊට, ඒකට | ඒවාට |
| අවධි | එයින්, ඉන්, ඒකෙන් | ඒවායින්, ඒවාඅතුරෙන්, ඒවාකෙරෙන් |
| සම්බන්ධ | එහි, ඒකේ | ඒවායේ |
| ආධාර | එයි, ඒකේ, ඒකෙහි | ඒවායේ |

45. මෙ ශබ්දය. (පුංලිඞ්ගයි)

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | මෙ, මූ, මේතෙම | මොහු, මොව්හු, මූලා, මොහුතුමූ, මූතුමූ |
| කර්ම | මොහු, මූ | මොවුන්, මූන්, මෙවුන් |
| කර්තෘ | මොහු, මූ (විසින්) | මොවුන්, මෙවුන්, මුන් (විසින්) |
| කරණ | මොහුගෙන්, මුගෙන්, මූකරණ කොට | මොවුන්ගෙන්, මුන්ගෙන්, මෙවුන්ගෙන් මුන්කරණකොට |
| සම්ප්‍රදාන | මොහුට, මූට, මූහට | මොවුන්ට, මෙවුන්ට, මුන්ට, මූන්හට |
| අවධි | මොහුගෙන්, මුගෙන් මූකෙරෙන් | මොවුන්ගෙන්, මෙවුන්ගෙන්, මූන්ගෙන්. මූන් (කෙරෙන්, අතුරෙන්) |
| සම්බන්ධ | මොහුගේ, මූගේ | මොවුන්ගේ, මෙවුන්ගේ, මූන්ගේ |
| ආධාර | මොහු කෙරෙහි, මූකෙරෙහි, මූ කෙරේ | මොවුන්කෙරෙහි, මෙවුන් කෙරෙහි, මූන් කෙරෙහි |

46. මේ ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගයි.)

| | ඒකවචන. | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | මේ, මෑ, මේතොම | මොව්හු, මොහුතුමූ. |
| කර්ම | මෑ, මෑය | මොවුන්, මූන් |

| | | |
|---|---|---|
| කර්තෘ | මෑ, මැය (විසින්) | මොවුන්,මුන්(විසින්) |
| කරණ | මැගෙන්,මැයගෙන්, මැය කාරණකොට | මොවුන්ගෙන්, මුන් ගෙන්, මුන් කාරණ කොට |
| සම්ප්‍රදාන | මෑට, මැයට, මෑහට | මොවුන්ට, මුන්ට, මොවුන්හට |
| අවධි | මැගෙන්,මැයගෙන්, මෑ කෙරෙන් | මොවුන්ගෙන්, මුන් ගෙන්, මොවුන් කෙ රෙන් |
| සම්බන්ධ | මැගේ, මැයගේ | මොවුන්ගේ,මුන්ගේ |
| ආධාර | මෑකෙරෙහි,මැයකෙ රෙහි, මෑ කෙරේ | මොවුන් කෙරෙහි මුන්කෙරෙහි |

බහුවචනයෙහි **මැලා** කියාද කථාවෙහි ව්‍යව හාරවේ.

### 47. මෙ ශබ්දය. (අප්‍රාණිකයි.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | මෙය, මේක | මේවා |
| කර්ම | මෙය, මේක | මේවා |
| කර්තෘ | මෙය, මේක | මේවා |
| කරණ | මෙයින්, මින්, මේකෙන් | මේවායින් |
| සම්ප්‍රදාන | මෙයට, මිට, මේකට | මේවාට |
| අවධි | මෙයින්, මින්, මේකෙන් | මේවායින්,මේවා අතුරෙන්,මේවා කෙරෙන් |
| සම්බන්ධ | මේකේ | මේවායේ |
| ආධාර | මෙහි, මේකේ | මේවායේ, මේවාවලැ |

### 48. තා ශබ්දය. (පුල්ලිඞ්ගිකයි )

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | තෝ | තෙපි, තෙප් |
| කර්ම | තා | තොප |
| කර්තෘ | තා,ත(විසින්) | තොප (විසින්) |

| | | |
|---|---|---|
| කරණ | තාකරණකොට, තාගෙන්, තගෙන් | තොපකරණකොට, තොපෙන්, තොපගෙන් |
| සම්ප්‍රදාන | තට, තාහට | තොපට, තොපහට |
| අවධි | තාගෙන්, තගෙන් | තොපෙන්, තොපගෙන් |
| සම්බන්ධ | තාගේ, තගේ | තොපේ, තොපගේ |
| ආධාර | තාකෙරෙහි, තාකෙරේ | තොපකෙරෙහි |

**49. තී ශබ්දය.** (ස්ත්‍රීලිඞ්ගිකයි.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | තී | තෙපි, තෙප් |
| කර්ම | ත් | තොප |
| කර්තෘ | තී, ති(විසින්) | තොප (විසින්) |
| කරණ | තීකරණකොට, තීගෙන්, තිගෙන් | තොපකරණකොට, තොපෙන්, තොපගෙන් |
| සම්ප්‍රදාන | තිට, තිහට | තොපට, තොපහට |
| අවධි | තිගෙන්, තිගෙන් | තොපෙන්, තොපගෙන් |
| සම්බන්ධ | තිගේ, තීගේ | තොපේ, තොපගේ |
| ආධාර | තීකෙරෙහි, තීකෙරේ | තොපකෙරෙහි |

බහුවචනයෙහි **තිලා** කියාද කථාවෙහි ව්‍යවහාරවේ.

**50. උඹ ශබ්දය.** (සමලිඞ්ගයි.)

| | | |
|---|---|---|
| ප්‍රථමා | උඹ | උඹලා |
| කර්ම | උඹ | උඹලා |
| කර්තෘ | උඹ විසින් | උඹලාවිසින් |
| කරණ | උඹෙන්, උඹ කරණකොට | උඹලාගෙන්, උඹලා කරණකොට |
| සම්ප්‍රදාන | උඹට, උඹහට | උඹලාට, උඹලාහට |
| අවධි | උඹෙන්, උඹ කෙරෙන් | උඹලාගෙන්, උඹලාකෙරෙන්, උඹලාඅතුරෙන් |
| සම්බන්ධ | උඹේ | උඹලාගේ |
| ආධාර | උඹකෙරෙහි, උඹකෙරේ | උඹලාකෙරෙහි |

**උඹ යනු තුඹ කියාද ව්‍යවහාරයි.**

## 51. ම ශබ්දය. (සමලිගුයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | මම, මම් | අපි, ඇප් |
| කර්ම | මා | අප |
| කර්තෘ | මා(විසින්,) ම(විසින්) | අප(විසින්) |
| කරණ | මාකරණකොට, මගෙන්, මාගෙන් | අපකාරණකොට, අපෙන්, අපගෙන් |
| සම්ප්‍රදාන | මට, මාහට | අපට, අපහට |
| අවධි | මගෙන්, මාගෙන් | අපෙන්, අපගෙන් |
| සම්බන්ධ | මගේ, මාගේ | අපේ, අපගේ |
| ආධාර | මාකෙරෙහි, මාකෙරේ | අපකෙරෙහි |

**සැලකියයුතුයි**:— (1) ප්‍රථම පුරුෂයෙහි එ ශබ්දයා කෙරෙන් උන්නැහේ, උන්නාන්සේ, උන්වහන්සේ යන ශබ්දද ගෞරවාර්‍ථයෙහි ව්‍යවහාරවෙත්.

(2) ඒක, ඕක, මේක, එය, ඔය, මෙය යන අචේතනික ශබ්දවලින් සිඩව ඒකා, ඕකා, මේකා, එයා, ඔයා, මෙයා, ඒකී, ඕකී, මේකී යන සචේතනික ශබ්දද කථාවෙහි අනාදරයෙන් ව්‍යවහාර වනබැව් පෙනේ.

(3) මධ්‍යමපුරුෂයෙහි, තමුසේ, තමුන්නාන්සේ තුඹවහන්සේ, ඔබ, ඔබවහන්සේ යනුද ගෞරවාර්‍ථයෙහි ව්‍යවහාරවෙත්. ඔබ සහ ඔබවහන්සේ යනු ප්‍රථම පුරුෂයෙහිදු ව්‍යවහාර වනබව පැරණි පොතපතින් පෙනේ.

(4) භාෂාන්තර සර්වනාම ශබ්දයන්ගෙන් හින් නාවූ සව්, කවර, අන්, ඉතුරු යනාදියහා තෙල, අර යන ශබ්දද සර්වනාමපද බව සැලකියයුතුයි. එයින් බොහොමයක් වෙනශබ්දයක් හා එකතුවද වරනැගෙත්.

අනිකා අනිකෙක් ආදිවශයෙන්. කවරයන්නෙන් කවරෙක්, කවරක්හු යනාදියද අර යන්නෙන් අරයා, අරූ, අරකා, අරකී යනාදියද සෑදෙත්. මෙයින් සමහරක් ග්‍රාම්‍යකයි.

## **ක්‍රියාශබ්ද.**

### **1. අඛ්‍යාක්‍රියා ශබ්ද+**

**52. රකින්නා** ශබ්දය. (පුල්ලිඞ්ගිකයි)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | රකින්නා | රකින්නෝ |
| කර්ම | රකින්නා | රකින්නන් |
| කර්තෘ | රකින්නා (විසින්) | රකින්නන් (විසින්) |
| කරණ | රකින්නා කරණකොට, රකින්නාගෙන් | රකින්නන් කරණකොට, රකින්නන්ගෙන් |
| සම්ප්‍රදාන | රකින්නාට, රකින්නාහට | රකින්නන්ට, රකින්නන්හට |
| අවධි | රකින්නාගෙන් | රකින්නන්ගෙන් |
| සම්බන්ධ | රකින්නාගේ | රකින්නන්ගේ |
| ආධාර | රකින්නාකෙරෙහි | රකින්නන්කෙරෙහි |
| ආලපන | රකින්න | රකින්නෙනි |

පිසන්නා, කරන්නා, දුවන්නා, නිදන්නා ආදි ශබ්දත් මෙසේමැයි.

**53 රකින්නී** ශබ්දය. (ස්ත්‍රී ලිඞ්ගිකයි)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | රකින්නී, රකින්නිය | රකින්නෝ, රකින්නියෝ * |

---

+ අඛ්‍යාක්‍රියා ශබ්දය යනු ක්‍රියාවකරන්නා හඟවන ශබ්දයි.

* මෙය පොතපතෙහි දක්නා නොලැබෙන නමුදු ව්‍යවහාරයෙහි පැනේ.

| | | |
|---|---|---|
| කර්ම | රකින්නී, රකින්නිය, | රකින්නන්, රකින්නියන් |
| කර්තෘ | රකින්නී, රකින්නිය (විසින්) | රකින්නන් (විසින්) රකින්නියන්(විසින්) |
| කරණ | රකින්නීකරණකොට, රකින්නියකරණකොට, රකින්නියගෙන් | රකින්නන් කරණකොට, රකින්නියන් කරණකොට, රකින්නන්ගෙන්, රකින්නියන්ගෙන් |
| සම්ප්‍රදාන | රකින්නීට, රකින්නියහට | රකින්නන්ට, රකින්නියන්ට |
| අවධි | රකින්නීගෙන්, රකින්නියගෙන් | රකින්නන්ගෙන්, රකින්නියන්ගෙන් |
| සම්බන්ධ | රකින්නීගේ, රකින්නියගේ | රකින්නන්ගේ, රකින්නියන්ගේ |
| ආධාර | රකින්නීකෙරෙහි, රකින්නියකෙරෙහි | රකින්නන්කෙරෙහි, රකින්නියන්කෙරෙහි |
| ආලපන | රකින්නී, රකින්නිය, රකින්නියේ | රකින්නෙනි, රකින්නියනි |

පිසන්නී, කරන්නී, දුවන්නී, නිදන්නී ආදියද මෙසේමැයි.

## 2 භාවක්‍රියා ශබ්ද +

### 54. රැකීම් ශබ්දය.

| | ඒකවචන. | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | රැකීම | රැකීම් |
| කර්ම | රැකීම | රැකීම් |
| කර්තෘ | රැකීම | රැකීම් |
| කරණ | රැකීමෙන් | රැකීම්වලින් |

+භාවක්‍රියාශබ්ද යනු ක්‍රියාමාත්‍රය ප්‍රකාශවූ භාවනා ශබ්දයි.

| | | |
|---|---|---|
| සම්ප්‍රදාන | රැකීමට | රැකීම්වලට |
| අවධි | රැකීමෙන් | රැකීම්වලින් |
| සම්බන්ධ | රැකීමේ | රැකීම්වල |
| ආධාර | රැකීමෙහි | රැකීම්වලැ |

පිසීම්, කිරීම්, දිවීම්, නිදීම් ආදියද මෙසේමැයි. පිසනු, කරනු, දුවනු, නිදනු යනුද පාඨයි.

### 1. ගුණශබ්ද

**55 රතු ශබ්දය.** (හුදෙක් ගුණවාචි ශබ්දවලැ බහුවචනය අප්‍රකටයි.)

| | |
|---|---|
| ප්‍රථමා —රත | සම්ප්‍රදාන—රතට |
| කර්ම —රත | අවධි —රතෙන් |
| කර්තෘ —රත | සම්බන්ධ—රතේ,රතෙහි |
| කරණ—රතෙන් | ආධාර —රතෙහි |

රතුයන්නෙන් හුදෙක් රතුපාටම හැඟේ.

සුදු, දුඹුරු, උස්, නිල්, ගැඹුරු ආදි ශබ්දද මෙසේමැයි.

කළු, සිනිදු, ආදි ශබ්ද වකාරාගමව මෙලෙසම වරනැඟෙත්.

### 2. ලිඞ්ගාශ්‍රිත ගුණශබ්ද

**56. රතුශබ්දය.** (පුල්ලිඞ්ගිකයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා- | රත්තා | රත්තෝ |
| කර්ම- | රත්තා | රත්තන් |
| කර්තෘ- | රත්තා (විසින්) | රත්තන් (විසින්) |
| කරණ- | රත්තාකරණකොට, රත්තාගෙන් | රත්තන්කරණකොට රත්තන්ගෙන් |
| සම්ප්‍රදාන- | රත්තාට, රත්තාහට | රත්තන්ට, රත්තන්හට |

| | | |
|---|---|---|
| අවධි- | රත්තාගෙන් | රත්තන්ගෙන් |
| සම්බන්ධ- | රත්තාගේ | රත්තන්ගේ |
| ආධාර- | රත්තාකෙරෙහි | රත්තන්කෙරෙහි |
| ආලපන- | රත්තා | රත්තෙනි |

සුදු ශබ්දාදියද සුද්දා සුද්දෝ යනාදි වශයෙන් මෙසේම වරනැගේ.

**57** රතු ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගිකයි.)

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමා | රත්තී | රත්තෝ, රත්තියෝ |
| කර්ම | රත්තී, රත්තිය | රත්තන්, රත්තියන් |
| කර්තෘ | රත්තී, රත්තිය (විසින්) | රත්තන් (විසින්), රත්තියන් (විසින්) |
| කරණ | රත්තීකරණකොට, රත්තියගෙන් | රත්තන් කරණකොට, රත්තියන්ගෙන් |
| සම්ප්‍රදාන | රත්තීට, රත්තියට | රත්තන්ට, රත්තියන්ට |
| අවධි | රත්තීගෙන්, රත්තියගෙන් | රත්තන්ගෙන්, රත්තියන්ගෙන් |
| සම්බන්ධ | රත්තීගේ, රත්තියගේ | රත්තන්ගේ, රත්තියන්ගේ |
| ආධාර | රත්තීකෙරෙහි, රත්තියකෙරෙහි | රත්තන් කෙරෙහි, රත්තියන් කෙරෙහි |
| ආලපන | රත්තිය, රත්තියේ | රත්තෙනි, රත්තියෙනි |

සුදු ශබ්දාදියද සුද්දි, සුද්දෝ, සුද්දියෝ ආදි වශයෙන් මෙසේම වරනැගේ.

**භාෂාන්තර ශබ්ද.**

**58.** පුරුෂ ශබ්දය (පුල්ලිඞ්ගිකයි) යකාරාගමව වරනැගේ.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | පුරුෂයා | පුරුෂයෝ |
| කර්ම | පුරුෂයා | පුරුෂයන් |

| | | |
|---|---|---|
| කර්තෘ | පුරුෂයා (විසින්) | පුරුෂයන් (විසින්) |
| කරණ | පුරුෂයා කරණකොට | පුරුෂයන් කරණකොට |
| සම්ප්‍රදාන | පුරුෂයාට | පුරුෂයන්ට |
| අවධි | පුරුෂයාගෙන් | පුරුෂයන්ගෙන් |
| සම්බන්ධ | පුරුෂයාගේ | පුරුෂයන්ගේ |
| ආධාර | පුරුෂයාකෙරෙහි | පුරුෂයන්කෙරෙහි |
| ආලපන | පුරුෂය | පුරුෂයෙනි |

අශ්ව, අස්ස, යක්ෂ, මනුෂ්‍ය, මනුස්ස, යෝධ, භට, ව්‍යාඝ්‍ර, මෘග, කින්නර ආදි ශබ්දද මෙසේමැයි.

දේවතා ආදි ශබ්ද එකාරාගමව මෙසේම වර නැගෙත්.

### 59 ස්ත්‍රී ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගිකයි.)

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ස්ත්‍රී | ස්ත්‍රියෝ, ස්ත්‍රීහු |
| කර්ම | ස්ත්‍රිය | ස්ත්‍රීන් |
| කර්තෘ | ස්ත්‍රී, ස්ත්‍රිය (විසින්) | ස්ත්‍රීන් (විසින්) |
| කරණ | ස්ත්‍රී, ස්ත්‍රිය කරණකොට, ස්ත්‍රියගෙන් | ස්ත්‍රීන් කරණකොට ස්ත්‍රීන්ගෙන් |
| සම්ප්‍රදාන | ස්ත්‍රීට, ස්ත්‍රියට | ස්ත්‍රීන්ට |
| අවධි | ස්ත්‍රීගෙන්, ස්ත්‍රියගෙන් | ස්ත්‍රීන්ගෙන් |
| සම්බන්ධ | ස්ත්‍රීගේ, ස්ත්‍රියගේ | ස්ත්‍රීන්ගේ |
| ආධාර | ස්ත්‍රී, ස්ත්‍රියකෙරෙහි | ස්ත්‍රීන්කෙරෙහි |
| ආලපන | ස්ත්‍රිය, ස්ත්‍රියේ | ස්ත්‍රීනි, ස්ත්‍රියෙනි |

සුන්දරී, කුමාරී, දේවී, රාඥී, බ්‍රාහ්මණී ආදි ශබ්දද මෙසේමැයි.

කන්‍යා, භාර්‍ය්‍යා, දාරා, දුහිතෘ, ආදි ශබ්ද එකාරාගමව මෙලෙසම වර නැගෙත්.

60. වෘක්ෂ ශබ්දය. (අචෛතනිකයි) යකාරාගමව වරනැගෙන්.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | වෘක්ෂය | වෘක්ෂයෝ, වෘක්ෂ |
| කර්ම | වෘක්ෂය | වෘක්ෂයන්, වෘක්ෂ |
| කර්තෘ | වෘක්ෂය | වෘක්ෂයන්, වෘක්ෂ |
| කරණ | වෘක්ෂයෙන් | වෘක්ෂවලින් |
| සම්ප්‍රදාන | වෘක්ෂයට | වෘක්ෂවලට |
| අවධි | වෘක්ෂයෙන් | වෘක්ෂවලින් |
| සම්බන්ධ | වෘක්ෂයේ | වෘක්ෂවල |
| ආධාර | වෘක්ෂයෙහි | වෘක්ෂවලැ |

ලොක, ආලොක, ගෘහ, අර්ථ, ග්‍රන්ථ, පුස්තක, පත්‍ර, වස්ත්‍ර, මාණික්‍ය, මංගල්‍ය ආදි ශබ්දද මෙසේමැයි.

ගංගා, විද්‍යා, ලතා, ශාලා, මාලා, ගණිකා, විණා, ආදිශබ්දද වකාරාගමව මෙලෙසම වරනැගෙත්.

---

## 6 වෙනි අභ්‍යාස පාඩම.

1. මෙහි පහත දක්වන ශබ්ද වරනගනු:—

නාන්නා, දෙසන්නි, බැණුම්, රිදුම්, නිල්, දිගු තරුණ, මහලු, සැදැහැවත්, දිරිමත්, පියතර, රාක්ෂස, යක්ෂිණි, මාතෘ, යන්ත්‍ර, තාරකා.

2. ලිඞ්ගාශ්‍රිත ගුණ ශබ්ද හතරක් වරනගනු.

3. කපන, අඬන, පුදන යන ක්‍රියාවලින් සිද්ධ අර්ථක්‍රියා ශබ්ද ලිඞ්ගයෙහිම වරනගනු. ඒවායේ හා ව ශබ්දවල ප්‍රථමා විභක්ත්‍යන්ත එකවචන බහුවචන දක්වනු.

## II පූර්වස්වර, මිශ්‍රවරූප සහ ආගම සන්ධි.

## Combination.

5. පූර්වාපරවර්ණයන් නිසි විධියෙන් ගැළපීම සන්ධිනම් වේ. එකලඟ සිටි අකුරු දෙකකින් මූලකුර

පූර්වවර්ණය නම්. පසුකුර පරවර්ණය නම්. ශුද්ධසිංහලෙහි සන්ධිකිරීම දස විධියකට කරනු ලැබේ. එයින් විධි තුනක් පමණක් මෙහි දක්වනු ලබන්නේය.

### 1 පූර්ව ස්වරලොප සන්ධිය.

6. පූර්ව ස්වරය ලොප්කොට පරස්වරය මුල පෙදෙහි අග ඉතිරිව සිටි ගාත්‍රාක්ෂරය කරා පැමිණවීමෙන් ගැළපෙන සන්ධිය පූර්ව ස්වරලොප සන්ධි නම්වේ.

"දින" යන පදයත් "ඉසුරු" යන පදයත් එකළගට පැමිණිකල මුල පදේ අග අකුර වන "න" යන්නේ ඇති අයන්නත් පසු පදේ මුලකුර වන ඉ යන්නත් සන්ධිවන අක්ෂරවෙත්. මේ ස්වර දෙකින් පූර්ව ස්වරය මකාදමනු ලැබේ. ඊට පූර්ව ස්වරය ලොප් කිරීමයයි කියති. එකල ඉතිරිවන ඉයන්න මුල පදේ අග ශෙෂව තිබෙන ගාත්‍රාක්ෂරය කරා පැමිණ "නි" යන්න කෙරේ. එවිට ඒ වචනදෙක එකක්වී දිනිසුරු කියා කියවේ. මෙහි පහත දක්වන සද හෙදයෙන්ද ඒ තව වඩා පැහැදිලි වන්නේය.

දින + ඉසුරු (පද දෙක)

දින් + අ + ඉසුරු (මුල පදේ නයන්නේ අයන්න වෙන්කළකල)

දින් + ඉසුරු (පූර්ව ස්වරයවූ අයන්න ලොප් කළකල)

දිනිසුරු (මුල පදේ "න්" යන්නට 'ඉ' යෙදූකල)

දිනිසුරු යනු සූපසිද්ධයි.

මේ අන්දමට සන්ධිවන තව පද ස්වල්පයක්ද මෙහි දක්වනු ලැබෙත්.

| | | | | |
|---|---|---|---|---|
| සුරු | + | අත– | සුරත | (දක්ෂිණ හස්තය) |
| දිගු | + | ආ | දිගා | (දීර්ඝාසුෂ්ඨ) |

| | | | |
|---|---|---|---|
| නැණ | + | ඇති– නැණැති | (නුවණඇති) |
| දෙ | + | ඈවර–දෑවර | (දෙවෙනිවර) |
| සුර | + | ඉඳු– සුරිඳු | (දෙවෙන්ද්‍රයි) |
| කනා | + | ඊල්– කනීල් | (රන්ඕවිලියි) |
| බමර | + | උදුල– බමරුදුල | (මල්පොකුර) |
| නොමර | + | ඌල් නොමරූල් | (වැලිනැතිඋල්පත) |
| යන | + | එන– යනෙන | (ගමනා ගමනය) |
| යළි | + | ඒගි– යළේගි | (වාරයෙහි) |
| දිය | + | ඔද– දියොද | (ජය සග ශක්තිය) |
| යට | + | ඕවිට යටෝවිට | (ගමක නමකි) |

සැලකිය යුතුයි. මේ සන්ධි ක්‍රමයට සන්ධිකළ හැක්කේ පූර්වාපරවර්ණයන් දෙකම ස්වරවූකල පමණකි. මේ ස්වරද අසමාන ස්වර වියයුතුයි. ස්වර දෙකක් එකතැන සිටි සියලු කල්හිම මේ ක්‍රමයටම සන්ධිවේයයි නොසිතිය යුතුයි. සන්ධිවීමෙන් සිඩ පදයක් මුලින් තිබුණු ස්වභාවට නැවත පැමිණවීමට විසන්ධි කිරීම යයි කියති.

—— oo ——

### 7 වෙනි අභ්‍යාසපාඨය.

1. මෙහි පහත දක්වන ශබ්ද සන්ධිකොට ගළපනු. ගෙන, එන; වට, ඕවිට; මිණි, එව්; දණ, උතු; කිගුරු, අල.

2. මෙහි පහත දක්වන ශබ්ද විසන්ධිකොට දක්වනු. ඌරල, නුවණැති, දිගැස, පහරොත, හඬෝනා.

### 2. විකෘති රූප සන්ධිය*.

7. පූර්ව පදයෙහි අග සිටි ස්වරයා ලොප්කොට ගාත්‍රාක්ෂරය දෙකක් බවට පමුණුවා (විකෘතිකොට)

* මිට විරූප සන්ධියයනු වඩා යොග්‍ය නාමයකි.

ගළපන සන්ධිය විරූප සන්ධි නම්. මෙහිදිද පසු පදෙ හිමුලසිටි ස්වරය විකාවූ ග ත්‍රාක්ෂරයට පැමිණේ.

"ඉති"ශබ්දය හා "අල"යන ශබ්දය එකළහ සිටි කල්හි පූර්ව පදයේ අග සිටි තියන්නේ ඇති ඉයන්න ලොප්කළ කල ඉත් + අල කියා සිදුවේ. 'ත්' යන්න විකාවූ කල්හි ඉත් + ත් + අල කියා සිටී. පසු පදෙහි මුලකුරවූ අයන්න තකාරයා කරා පැමිණවූ කල ඉත්තල කියා සිදුවේ.

මේ ක්‍රමයට සන්ධිවන ශබ්ද ස්වල්පයක් මෙහි පහත දක්වනු ලැබේ.

වැලි + අවුරු=වැල්ලවුරු (වාලුකා ප්‍රාකාරය)
තඹපලු + එවි=තඹපල්ලෙවි (ළපටි දලුවැනි)
කුලු + එවි=කුල්ලෙවි (කුල්ලවැන)

8. ඇතම්විට පූර්ව පදයෙහි අග අකුර ස්වර රහිත ගාත්‍රාක්ෂරයක්වූ කල ස්වර ලොපයක් නැතිවද සන්ධිය සිදුවේ.

උදාහරණ:-වල් + අම්බලම
වල් + ල් + අම්බලම=වල්ලම්බලම
වක් + අත්ත
වක් + ක් + අත්ත=වක්කත්ත.

———o———

### 8 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහි පහත දක්වන ශබ්ද සන්ධිකොට ගළපනු. හෙලිලි, අඹු; බත්, උල; තල්, අත්ත; වැලි, අඟුන; අඹදලු, එවි.

2. මෙහි පහත දක්වන ශබ්ද විසන්ධිකොට දක්වනු. කොල්ලාට; මහල්ලාගේ; කටුස්සාගෙන්; ගිනිදල්ලෙන්; පොල්ලත්ත.

## 3 ආගම සන්ධිය.

9. ස්වරයක් ආශ්‍රයකොට ගෙන ව්‍යඤ්ජනාක්ෂරයක් අමුතුව පැමිණීමෙන් ගැලපෙන සන්ධිය ආගම සන්ධි නම්.

"වී" යන පදය හා "අවුල" යන පදය එකලඟ සිටි කල ඒ දෙක අතරට "ය්" යන්නක් ආගමවැ පසු පෙදෙහි මුලකුරවූ අයන්න ඒ "ය්" කාරය කරා පැමිණිකල වියවුල කියා සිඩවේ. පහත දක්වන පද භෙදයෙන් මෙය තව වඩා පැහැදිලිවේ.

වි + අවුල (පදදෙක)
වි + ය් + අවුල (ය් කාරය ආගමවූකල
වියවුල (අකාරය යකාරසථවීමෙන්)

මේ සන්ධි ක්‍රමයට සාමාන්‍යයෙන් ආගමවන්නේ ය්, ව්, ර් යන ව්‍යඤ්ජනයි. යකාරාගමය වන හැටි යටකී උදාහරණයෙන් පෙන්වන ලද්දේය.

වකාරාගමයෙන් සන්ධිවීමට උදාහරණයක්:-

කටු + අල
කටු + ව් + අල
කටුවල

රකාරාගමයෙන් සන්ධිවීමට උදාහරණයක්:-

නි + අවුල්
නි + ර් + අවුල්
න්රවුල්

සැලකිය යුතුයි:-(1) කිසි තැනෙක "න" කාරාගම යන්ද වනබැව් පෙනේ.

උදාහරණ:- අ + ඉවු=අ + න් + ඉවු=අනිවුයනාදියයි.

(2) අක්ෂරයක් ආගම වන්නේ සාමාන්‍යයෙන් පූර්ව වර්ණයාගේ උත්පත්ති ස්ථානය ආශ්‍රය කරගෙන වේ. පූර්ව වර්ණය "ඉ" යන්න නම් යකාරයක් ආගම වීමද, "උ" යන්න නම් "ව" කාරයක් ආගමවීමද බහුලව සිදුවේ.

———o———

## 9 වෙනි අභ්‍යාස පාඨය

———o———

1. මෙහි පහත දක්වන ශබ්ද සන්ධිකොට ගළපනු:-සිපි, එව්; සිව්, අඟ; පුත, උන්; නොවූ, අතු; තුනු, අඟ; කළු, අග්ගල.

2. මෙහි පහත දක්වන ශබ්ද විසන්ධිකොට පෙන්වනු:-නිරය; පිරියත්; කවුවාන; නිරෝද; නොයෙක්; නිරලඹ.

### III විධි ක්‍රියාව.

The Imperative Mood.

10. යමක් කිරීමට අණදීමෙහි යොදන ක්‍රියාව **විධි ක්‍රියා** නම්වේ. ඒ ආදරයෙන් හෝ අනාදරයෙන් වේ. උදාහරණ:- දන්දෙන්නෑ; ගමටපල.

11. අතීත කාලයෙහි සහ උත්තම පුරුෂයෙහි විධි ක්‍රියාව නොයෙදේ.

12. මධ්‍යම පුරුෂ එකවචන විධික්‍රියා පිය, පන් යන ප්‍රත්‍යවලින් අන්තවෙත්:- උදා:- තෝ දුවපිය, උඹ දුවපන්.

13. මධ්‍යම පුරුෂ බහුවචන විධි ක්‍රියා අව්, පියව්, පල්ලා යන ප්‍රත්‍යවලින් අන්තවෙත්. උදා:- තොපි දුවව්, දුවපියව්; නුඹලා දුවපල්ලා.

14. කර, විදුව, ගනුව ආදිතැන අ ප්‍රත්‍යයද, සිටු, ඉඳු, දකු ආදිතැන උ ප්‍රත්‍යයද විධි ක්‍රියාවට ඇතිබැව් පෙනේ.

15. ප්‍රථම පුරුෂ විධි ක්‍රියා ව්‍යවහාරය ඉතා විරලය.

16. අනාගත කාලයට විශෙෂ ප්‍රත්‍යයෝ විධි ක්‍රියා වෙති අප්‍රකටයහ.

17. ආදරාර්ථයෙහි යෙදෙන අන්නෑ ප්‍රත්‍යය දැන් අන්ට, අන්ඩ කියා ව්‍යවහාරවන බව පෙනේ. උදා:- දම් දෙසන්ට, දම් දෙසන්ඩ.

18. අව මැනව්, බලනු මැනව ආදි තැන ගෞරව වශයෙන් කරන විධානයකුත් පැනේ.

19. ආයුබෝවන්, සැරදේ, නිදුකින් පවතු ආදි යෙදුම් ආශීර්වාදය ගර්භකොට ඇති විධික්‍රියාවේම කොටසකි.

---

## 10 වෙනි අභ්‍යාස පාඨය.

---

1. ආදරාර්ථයෙහි විධික්‍රියා පසක් දක්වනු. 2. අනාදරාර්ථයෙහි විධික්‍රියා හතරක් දක්වනු. 3. ගෞරව වශයෙන් කරන විධානය උදාහරණ තුනකින් පෙන්වනු. 4. ආශීර්වාද ගර්භකොට ඇති විධි ක්‍රියාවට නිදර්ශන හතරක් දෙනු. 5. මෙහි පහත දක්වන පාඨවල ඉරි ඇති තැන් සුදුසු විධික්‍රියාවලින් පුරවනු. (1) මිතුර කළයුතුදේ අදම—— (2) දරුව සුචරිතයෙහි—— (3) කොල දූෂවය මෙතැනින්—— (4) සාමිනි මට—— (5) ඔබ දිගාකල්——

## IV පූර්වක්‍රියාව සහ මිශ්‍රක්‍රියාව.

Participles of Verbs.

### 1. පූර්ව ක්‍රියාව.

---o---

20. එකම කර්තෘවෙකුට අයත් ක්‍රියා දෙකක් හෝ කීපයක් ඇතිවිට අවසාන ක්‍රියාවට මුලින් පිහිටි ක්‍රියා පූර්වක්‍රියායි. "ශ්‍රමණ කා බී ඇඳ පැළඳ පාඨශාලාවට ගියේය" යනවාක්‍යයෙහි ගියේය යන නිෂ්ඨාක්‍රියාවට මුලින් පිහිටි කා, බී, ඇඳ, පැළඳ, යන ක්‍රියා පූර්වක්‍රියා වෝයි.

21. පූර්වක්‍රියා නානා ප්‍රත්‍යයන්ගෙන් සිඩවෙති. අ, ඇ,ආ, අලා, ආලා, ඇලා, ඊ, ඉන්, ඊලා, ඉන්ලා ආදිය මිට අයිති ප්‍රත්‍යයෝය.

අ–ගෙය අත්හැර ගියේය. ඇලා–ගොනෙකු දකලා බියවිය.

ඇ–පව්කරු අපායගත නොවේ. ඊ–රා බි මත්වූහු.

ආ–ගස කඩා දැමුයේය. ඉන්–නුවර ගොසින් ආවේය.

අලා–බත පිසලා කෑවේය. ඊලා–දන් දීලා සතුටු වෙත්.

ආලා–මල් නෙලාලා ගෙනාවෙහිද? ඉන්ලා–ගෙට ඇවිදින්ලා ඉඳගති.

22. අද, අවුත්, ඇවිත්, අවුදු, ගොස් යනාදියද පූර්ව ක්‍රියාවශයෙන් යෙදෙත්.

අද–සුරෙක් සුරපුරෙන් **අද** උපනි.
අවුත්– පිරිසරින් නුවරට **අවුත්** වන්හ.
ඇවිත්–ගෙට **ඇවිත්** ගියේය.
අවුදු–නුවරට **අවුදු** අබිසෙස්ලදී
ගොස්–ගමට **ගොස්** එන්නෙමි.

23. නොඛණ්ඩසේතිද පූර්වක්‍රියාව යෙදේ. "වැසී වැය ගඟ පිරිණී" යන්නෙහි වැය යන පූර්ව ක්‍රියාව වැසිවැසීම හෙතුකොටගෙන අනාගතාර්ථයක් ගෙනදේ.

හුළංවැදී ගස බිඳේ, රකුසා දැක බියවිය යනුද ඊට උදාහරණයි. හෙත්වර්ථයෙහි පූර්වක්‍රියා බොහෝවිට භින්න කර්තෘකව සිටින්. වැසිවැස ගඟ පිරිණි කී කල වැස යන්නෙහි කර්තෘ වැස්සද, පිරිණි යන්නෙහි කර්තෘ ගඟදවේ.

## 2 මිශ්‍ර ක්‍රියාව.

24. අන්‍ය ක්‍රියාවක් හා මිශ්‍රව පවතින ක්‍රියාව **මිශ්‍රක්‍රියා** නම්. "කොල්ලා ගොරවමින් නිදයි" කීකල ගෙරවිමත් නිදීමත් එකවිට කෙරෙන නිසා පළමු ක්‍රියාව දෙවැන්න හා මිශ්‍රව පවතින බැවින් ගොරවමින් යන්නට මිශ්‍ර ක්‍රියාවයයි කියනු ලැබේ.

මිශ්‍ර ක්‍රියා සිඩියට ගන්නා ප්‍රත්‍ය මින්, මින, මිනි යනු වෙත්.

මින්–ගී කියමි**න්** නටයි
මින–හඬමි**න** ගියේයි.
මිනි–මිලියෙමි**නි** සැඟවි.

25. පූර්ව ක්‍රියා ද්විත්වවූ කලද මිශ්‍ර ක්‍රියා බවටයේ. "ඈ බැණ බැණ ගියාය" කීකල "බැණ බැණ" පූර්ව ක්‍රියා ද්විත්වය බණිමින් යන මිශ්‍ර ක්‍රියාර්ථය ගනී.

## 11 වෙනි අභ්‍යාස පාඨය.

1. ආ, ඊ, ඉන්, අලා යන ප්‍රත්‍යයන්ගෙන් සිඩ පූර්ව ක්‍රියා හතරක් දක්වනු.

2. කර, කොට, බීලා, ගොසින්ලා යන ක්‍රියා පදවල ප්‍රත්‍ය වෙන්කරනු.

3. අවුත්, අවුදු, ගොස් යන පූර්වක්‍රියා යොදා වාක්‍ය තුනක් තනනු.

4. හෙත්වර්ථයෙහි පූර්වක්‍රියා යෙදෙනහැටි උදාහරණ තුනකින් පෙන්වනු.

5. මින්, මින යන ප්‍රත්‍යයන්ගෙන් සෑදෙන මිශ්‍ර ක්‍රියා සයක්ද පූර්ව ක්‍රියා ද්විත්වවීමෙන් සිඩවන මිශ්‍ර ක්‍රියා පසක්ද උදාහරණ කරනු.

———o———

## වාක්‍ය තැනීම.

Construction of Sentences.

26. සම්පූර්ණ වාක්‍යයක් ඇතිවීමට කර්තෘ සහ

ක්‍රියාව ආවශ්‍යකබවත් ඇතම් තැන කර්මයක් වුවමනා බවත් මීට ප්‍රථම ග්‍රන්ථයේ දක්වන ලද්දේය. නුමුත් කියයුතු සියල්ල දක්වීම කර්තෘ, කර්ම, ක්‍රියා යන්නෙන් පමණක් කළ හැකි නොවේ. ඒ පිණිස කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර, ආලපන යන අවශේෂ විභක්ත්‍යන්ත පදද ව්‍යවහාරකිරීම වුවමනාවේ.

නිදර්ශන:—

කර්තෘ සහ ක්‍රියාව පමණක් ඇති වාක්‍යයක්:—ළමයා නිදයි.
කර්ම විභක්ත්‍යන්ත පදයක් " " ගුරුහු **අකුරු** කරවති.
කරණවිභක්ත්‍යන්ත පදයක් " " **පොරවෙන්** ගස කැපී.
සම්ප්‍රදාන විභක්ත්‍යන්ත " " " **දුගියාට** දන්දුන්හු.
අවධි විභක්ත්‍යන්ත " " " **පොළොවෙන්** රස ලැබේ.
සම්බන්ධ විභක්ත්‍යන්ත " " " **ගොනාගේ** අග කඩන්නෙමි.
ආධාර විභක්ත්‍යන්ත " " " **අහසෙහි** තරු බබලති.
ආලපන විභක්ත්‍යන්ත " " " **පුතේ** තෝ කොහේ ගියෙහිද?

27. ඇතම් වාක්‍යවල විධි ක්‍රියා පදද යෙදෙත්.
උදා:—අපට අකුරු **කියවන්ඩ**; මෙහාට **වර**.

28. ඇතම් වාක්‍යවල පූර්වක්‍රියා පදද යෙදෙත්.

උදා:—කොළඹ **ගොසින්** හෙට එන්නෙමි.

29. ඇතම් වාක්‍යවල මිශ්‍රක්‍රියා පදද යෙදෙත්.

උදා:—ළමයා **හඬමින්** ගෙදර ගියේය.

30. ඇතම් වාක්‍යවල වෙන වෙන විභක්ත්‍යන්ත පද කීපයක් හා ක්‍රියාපද කීපයක්ද යෙදෙත්.

උදා:—යොදින් අකුරු උගෙන සව් සතුන් කෙරෙහි මෙත් කුළුණු යුතුවැ සුසිරි වඩමින් පවතු.

## 12 වෙනි අභ්‍යාසපාඨය.

මෙහි පහත දක්වන වාක්‍යයේ ඇති නාම පද යන්ගේ විභක්තිද, ක්‍රියාපදයන්ගේ වෙන වෙන නම්ද දක්වනු.

වගුරට සිංහබාහුරජුගේ පිත් විජයකුමරු සත් සියයක් සෙනග පිරිවරකොට ගෙන ලඬකාවට විත් තම්මැන්න නමින් නුවරක් ඉදිකොට දසරාජ ධර්‍මයෙන් ජනරඤ්ජනය කෙරෙමින් අටතිස් වසක් ලඬකා රාජ්‍යානුශාසනාව කළේය.

## විශෙෂණ.

31. කිසිතැනෙක පද කීපයක් තව පදයක විශෙෂණය මෙන් යෙදෙත්. උදා:— ඉතා උස ගහ; දුක් විඳින මිනිහා; ජලයෙන්පිරි ගංගාව; පරවැඩෙහි නියුක්ත ජනසමාගම යන පාඨවල ඉතා උස යනු ගහ යන්නටද, දුක්විඳින යනු මිනිහා යන්නටද, ජලයෙන් පිරි යනු ගංගාව යන්නටද, පරවැඩෙහි නියුක්ත යනු ජන යන්නටද, පරවැඩෙහි නියුක්ත ජන යනු සමාගම යන්නටද විශෙෂණවතිබේ. **වාක්‍ය තැනීමේදී මෙයද කල්පනාවට ගතයුතුය.**

## 13 වෙනි අභ්‍යාස පාඨය.

1. පද දෙකක්, තුනක්, හතරක්. සහ පහක් විශෙෂණ කොටසට එන පරිද්දෙන් වාක්‍ය පහක් තනනු.

2. මෙහි පහත දක්වන වාක්‍යවල ඉරිගසාඇති තැන් සුදුසු විභක්ත්‍යන්ත පදයන්ගෙන් පුරවනු.

1. අරක්කැමියා——බත පිසී. 2. ——දන්දුන් නේය. 3. ළමයා—— වැටී මළේය. 4. මේ——වතුර මිහිරියි. 5. ගුරුවරයා——වාඩිවිය. 6. කොල——තා කළදේ කුමක්ද?

3. මෙහි පහත දෙන ශබ්දයන් විශෙෂණ වශයෙන්ද; නාමපද වශයෙන්ද යොදා වාක්‍ය දහයක් සාදනු. සුදු, රතු, දුවිත, මහලු සහ යහළු.

## 14 වෙනි අභ්‍යාස පාඨය.

1. විශෙෂණයක් සහ මිශ්‍ර ක්‍රියාවක්ද ඇතිවන වාක්‍ය පහක් තනනු.

2. විශෙෂණ දෙකක් හා පූර්වක්‍රියා දෙකක්ද ඇති වාක්‍ය පහක් සාදනු.

3. මිශ්‍ර ක්‍රියාවක් හා පූර්වක්‍රියාවක්ද විධික්‍රියාවක්ද ඇති වාක්‍යපහක් තනනු.

4. වෙන වෙන විභක්ත්‍යන්ත පද හතර බැගින් ඇති වාක්‍ය පහක් සාදනු.

5. විභක්ති නවයද, පූර්වක්‍රියාවක් හා මිශ්‍ර ක්‍රියාවක්ද, විධික්‍රියාවක්ද ඇති වාක්‍යයක් තනනු.



